# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1607/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி
දිනය / Date — 21/12/2023 පැය 2125

## මාධ්‍ය නිවේදනය

**මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැක කරන මුදල් හා දේපල පොලිස් භාරයට ගැනීම - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

2023.12.17 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක 'යුක්තිය' විශේෂ මෙහෙයුමට සමගාමීව 2023.12.20 වන දින නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශන සිදුකර මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැක කරනු ලබන රුපියල් ලක්ෂ 920 ක් පමණ වටිනාකමකින් යුත් වාහන, ඉඩම්, නිවාස හා රත්රන් තොගයක්ද එම කොට්ඨාසය භාරයට ගෙන ඇත.

නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය භාරයට ගන්නා ලද දේපල අතර සුඛෝපභෝගී බස් රථ 02 ක්, බස් රථයක්, කාර් රථ 02 ක්, හා යතුරුපැදි 02 ක් වන අතර එහි වටිනාකම රුපියල් ලක්ෂ 410 ක් පමණ වේ. තවද කිරිවත්තුඩුව ප්‍රදේශයේ පිහිටි දෙමහල් නිවසක් සහ එම ප්‍රදේශයේම පිහිටි පර්චස් 10 බැගින් වූ ඉඩම් කැබලි 02 ක් ද, තෙමහල් කඩ කාමරයක්ද රත්රන් තොගයක් ද වන අතර ඒවායෙහි වටිනාකම රුපියල් ලක්ෂ 510 ක් පමණ වේ. තවද රුපියල් 123,000/= මුදලක් ද පොලිස් භාරයට ගෙන ඇත. .

2023.12.21 වන අද දින උදෑසන කිරුළපන ඇවනියු, කොළඹ 05 ලිපිනයේ පිහිටි එම කොට්ඨාසයේදී වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් අදාල රථවාහන පරීක්ෂාවට ලක් කල අතර එම අවස්ථාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂ සහ උසස් නිලධාරීන්ද සහභාගී විය.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.